# ව්‍යාපාර අධ්‍යනය

# 06 වන පාඩම

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

**දේශක - කුෂාන් වීරහැන්නැදිගේ**
**BA (sp) Economics (SUSL)**

# සූළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

සූළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා ජාතකි මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විවිධ නිර්ණායක භාවිත කරයි. එම නිර්ණායක පදනම් වී ඇත්තේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක මතය.

 ප්‍රමාණාත්මක සාධක වශයෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක ව ගණනය කළ හැකි සාධකය.

නිදසුන් : ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය, යොදා ගන්නා සේවක සංඛ්‍යාව, භාවිතයට ගන්නා බල ශක්තිය, වාර්ෂික පිරිවැටුම

 ගුණාත්මක සාධක යන්නෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක වශයෙන් මැනිය නො හැකි සාධක ය.

නිදසුන් : ව්‍යාපාර සංවිධාන ක්‍රමය, භාවිත කරන තාක්ෂණය, වෙළෙඳපොළ ස්වභාවය

 ඉහත නිර්ණායක පදනම් කර ගෙන දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.

නිදසුන් : ස්වාධීනව අයිති හා ස්වාධීන ව ක්‍රියාත්මක වන එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ.
ඇමරිකා එක්සත් ජනපදයේ ස්මෝල් බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන් ආයතනය **(Small Business Administration Institute - USA)**

# කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ද විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිත කරයි.

| ආයතනය | නිර්ණායකය |
|---|---|
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය | 1. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 2. කාර්මික තාක්ෂණික ආයතනය | 2. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 3. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 4. ආයෝජිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 20 නොඉක්මවන ව්‍යාපාර |
| 5. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 5. සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර |
| 6. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 6. ස්ථිර සේවක සංඛ්‍යාව 50 ට අඩු ව්‍යාපාර |
| 7. ශ්‍රී ලංකා මහ බැංකුව | 7. භාවිත කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ව්‍යාපාර |

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ පහත දැක්වේ

- වෙළෙඳපොළ කුඩා වීම
- ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම
- සේවක සංඛ්‍යාව අඩු වීම
- පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත කිරීම
- තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදු වීම
- ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම හා බොහෝ විට අයිතිකරු ප්‍රධාන කළමනාකරු වීම
- වෙළෙඳපොළ බොහෝ විට දේශීය වීම (නමුත් සමහර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විදේශීය වෙළෙඳපොළට ද නිෂ්පාදිත සපයයි)
- විශාල ව්‍යාපාරවලට සාපේක්ෂව මේවායේ මූල්‍ය බැඳීම් අඩු වීම
- නවීන තාක්ෂණය භාවිතය අඩු වීම

## රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ ආකාරයෙන් දායකත්වය ලබා දෙයි.

- මෙම ව්‍යාපාර ශ්‍රම සුක්ෂම කර්මාන්ත නිසා වැඩි රැකියා ප්‍රමාණයක් සැපයිය හැකි වීම
- ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම
- දේශීය සම්පත් භාවිත කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය හේතුවෙන් නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම
- ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම
- මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය ලබා දීම
- මහා පරිමාණ ව්‍යාපාර ඉටු නො කරන ව්‍යාපාර කටයුතුවල නිරත වීම

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී පහත කරුණු පිළිබඳව සැලකිළිමත් විය යුතුය

-  තම හැකියා හා කුසලතා පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා ඇගැයීම
-  නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ හා එම වෙළෙඳපොළට ළගාවිය හැකිද යන්න
-  ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීම
-  ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳව අධ්‍යයනය
-  ව්‍යාපාර සංවිධාන ක්‍රමය හා පවතින නීති රීති
-  පවතින තරගකාරිත්වය

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට බලපා ඇති හේතු

- ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබීම
- මූල්‍ය හා බදු සහන වැනි දිරිගැන්වීම්
- පුළුල් වෙළෙඳපොළක් පැවතීම
- විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබා දීම
- දක්ෂ කළමනාකරණයක් තිබීම
- ව්‍යාපාරිකයින්ගේ උනන්දුව හා කැපවීම

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු

- මූල්‍ය ගැටලු
- වෙළෙඳපොළ තරගකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම
- කළමනාකරණයේ දුර්වලතා
- ව්‍යවසායකත්ව හැකියා අඩු වීම
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම
- නව තාක්ෂණික දැනුම අඩුකම හා නව තාක්ෂණය යොදා නො ගැනීම

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන අතර ඊට හේතු කිහිපයකි

- ව්‍යාපාර ඇරඹීම අවදානම් සහගත වීම, එහෙත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව තුළින් එය අවම කර ගත හැකි ය.

- ව්‍යවසායකයාගේ කැපවීම හා උනන්දුව මත බොහෝ දුරට ව්‍යාපාරය සාර්ථක වේ.

- ව්‍යවසායකයා තුළ ඇති ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපායි.

- එසේ ම ව්‍යවසායකයා තුළ ඇති ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමෙන් ව්‍යාපාර සාර්ථක කර ගත හැකි වේ.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති පියවර ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

- මූල්‍යමය දිරිගැන්වීම්
- මූල්‍යමය නො වන දිරිගැන්වීම්

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය දිරිගැන්වීම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ

- කෙටිකාලීන හා දිගුකාලීන ණය
- මූල්‍යමය ආධාර
- බදු සහන
- ප්‍රතිමූල්‍ය පහසුකම්

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීමට රජය ගෙන ඇති මූල්‍යමය නො වන දිරි ගැන්වීම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.**

- උපදේශන සේවා
- ව්‍යවසායක සංවර්ධන වැඩ සටහන්
- පර්යේෂණ හා තාක්ෂණික සේවා
- යටිතල පහසුකම් සැපයීම
- වෙළෙඳපොළ පහසුකම් ලබා දීම/අලෙවි පහසුකම්
- විශිෂ්ටතා හා සම්මාන ලබා දීම

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන කොටස් දෙකකට බෙදේ

- රාජ්‍ය ආයතන
- වෙනත් ආයතන

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන රාජ්‍ය ආයතන කිහිපයකට නිදසුන් පහත දැක්වේ

- කාර්මික සංවර්ධන මණ්ඩලය
- අපනයන සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ජාතික සංවර්ධන බැංකුව
- කාර්මික තාක්ෂණ ආයතනය

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන වෙනත් ආයතන හා සංවිධාන කිහිපයකට නිදසුන් පහත දැක්වේ

-  සර්වෝදය
-  ජයිකා (ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය )
-  බදු වාර්තා සකස් කර දෙන පෞද්ගලික ආයතන
-  සණස (සකසුරුවම් හා ණය දෙන සමිති )
-  පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතන

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් කිහිපයක් පහත දැක්වේ

| ආයතනය | ලබා දෙන දිරි ගැන්වීම් |
|---|---|
|  ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA ) |  මූල්‍යමය පහසුකම් ලබා දීම<br> ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම |
|  කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය |  විදේශ වෙළෙඳපොළ පහසුකම් සපයා දීම |
|  කාර්මික සංවර්ධන මණ්ඩලය |  උපදේශන සේවා<br> තාක්ෂණික දැනුම ලබා දීම<br> යටිතල පහසුකම් |
|  අපනයන සංවර්ධන මණ්ඩලය |  අලෙවි පහසුකම්<br> උපදේශන සේවා |
|  ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |  උපදේශන සේවා |
|  ජාතික සංවර්ධන බැංකුව |  මූල්‍ය පහසුකම් ලබා දීම |
|  කාර්මික තාක්ෂණ ආයතනය |  තාක්ෂණික දැනුම ලබා දීම<br> උපදේශන සේවා සැපයීම |
|  ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) |  මූල්‍ය පහසුකම්  විශිෂ්ටතා සම්මාන ලබා දීම |

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරිගැන්වීම් ලබා දෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කිහිපයක් පහත දැක්වේ.

## කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

## (ලිය ඉසුර)

කාරක ප්‍රාග්ධන සහාය සැපයීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා සුරැකුම් අවශ්‍ය නො වන කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත. (2014 මහ බැංකු වාර්තාව)

## සහන්යා

සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයකි. මේ සඳහා DFCC බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධ වී ඇත.

## සණස ණය ව්‍යාපෘතිය

කෘෂි, සත්ව, කුඩා කර්මාන්ත, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදවා ගන්නා අතර සණස මහා සංවර්ධන සංගමය පරිපාලන කටයුතු සිදු කරයි.

# සමුපකාර ග්‍රාමීය බැංකු ණය

කෘෂි, ධීවර, සත්ව පාලනය, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සැපයීම මෙ මගින් සිදු කරයි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ. මේ සඳහා විවිධ සේවා සමුපකාර සමිති හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරිපාලන දායකත්වය ලබා දෙයි.

# සුචන

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රාහකත්වයෙන්, ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් සුළු කර්මාන්ත ව්‍යවසායකයින් නංවාලීම සඳහා ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම යකි මෙය SMILE (Small & Micro Industries Leader & Entrepreneur promotion project ) ලෙස ද හඳුන්වයි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මෙහි III වන අදියරය.

# සමෘද්ධි/දිවිනැගුම සංවර්ධන ණය යෝජනා ක්‍රමය

සමෘද්ධිය/දිවිනැගුම බැංකු සංගම් හරහා සමෘද්ධිලාභීන් වෙත ණය දීම හා අනෙකුත් සේවා සැපයීම සිදු කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත.

මේ සඳහා අවශ්‍ය මුදල් රජයේ ප්‍රධානයන්ගෙන් හා සාමාජිකයින්ගේ තැන්පතු මගින් රැස් කළ ඉතුරුම් මුදල් තුළින් ලබා ගනියි.

මෙහි පාලනය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

# ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය

(කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ඇති) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි.

වගා කටයුතු සඳහා ගොවීන්ට කෙටි කාලීන ණය හා දිගුකාලීන ණය ලබා දෙයි.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ.

ඉදිරි VIDEO බැලීම සඳහා SUBSCRIBE කරන්න

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."